කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම - 2023

-----------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය නොකළ මතය

කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ සාංගමික ව්‍යවස්ථාවලියට අදාළ 13 (ආ) වගන්තිය | සමාගමක කොටස් හිමියන්ගේ අයිතිවාසිකම් හා බැඳීම් පිළිබඳව විධිවිධාන සැලැස්විය යුතුය. කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ අංක 02 ප්‍රකාරව සමාගම, භාණ්ඩාගාරයේ ලේකම් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර පොදු ගිවිසුමක් (Master Agreement) ඇති කරගත යුතු වුවද සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. නීතිපතිවරයාගේ අනුමැතිය ඇතිව සාංගමික ව්‍යවස්ථාවලියේ වගන්ති නියමිත කාලයේදී සංශෝධනය කෙරේ. | 2007 අංක 07 දරන සමාගම් පනතේ සාංගමික ව්‍යවස්ථාවලියට අදාළ 13(ආ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 ජනවාරි 14 දිනැති අංක PED 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | i. 2023 මාර්තු 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ තීරණ අංක 13 ට අනුව වැටුපට අමතරව ගෙවනු ලබන සියලු දීමනා සඳහා රජයේ චක්‍රලේඛ අදාළ කරගත යුතු බව දක්වා තිබියදී ඉහළ කළමනාකරණ මට්ටමේ (HM1) නිලධාරීන්ට ඉන්ධන දීමනාව ලෙස මාසික තෙල් ලීටර් ප්‍රමාණය ගෙවිය යුතු වුවද සමාගම විසින් ඊට පටහැනිව 2023 වර්ෂයේ නිලධාරීන් 19 කට රු. 4,441,459 ක් ගෙවා තිබුණි.<br><br>ii. නිල වාහන හිමිකාරීත්වය හිමි නොවන නිලධාරීන් 20 කට 2023 වර්ෂයේ වාහන දීමනා ලෙස රු. 4,231,577 ක් ගෙවා තිබුණි. | එකඟ නොවේ. | 2023 මාර්තු 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව 2022 ජනවාරි 14 දිනැති අංක PED 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ- -යේ 2017 ඔක්තෝබර් 25 දිනැති අංක එම්.එස්.ඩී./ චක්‍රලේඛ/ 2017 දරන කළමනාකර- -ණ සේවා චක්‍රලේඛ 05/2017 | 2023 මාර්තු 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවේ තීරණ අංක 13 ට අනුව වැටුපට අමතරව ගෙවනු ලබන සියලු දීමනා සඳහා රජයේ චක්‍රලේඛ අදාළ කරගත යුතු බව දක්වා තිබියදී සහ සමාගමේ සියලු නිලධාරීන්ගේ සක්‍රීය සේවා කාලය වර්ෂ 06 කට අඩු බැවින් එම චක්‍රලේඛය ප්‍රකාරව මසකට ගෙවිය හැකි උපරිම වෘත්තීය දීමනාව රු. 3,000 ක් වූයෙන් 2023 වර්ෂයේ සමාගමේ නිලධාරීන් 13 කට ගෙවිය යුතු වෘත්තීය දීමනාව රු. 282,000 ක් වුවද සමාගම විසින් රු. 2,237,600 ක මුදලක් ගෙවා තිබුණි. | එකඟ නොවේ. | 2023 මාර්තු 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2017 ඔක්තෝබර් 25 දිනැති අංක එම්.එස්.ඩී./ චක්‍රලේඛ/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ 05/2017 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතේ අංක 5.3 ඡේදය | බදු පසු ලාභයෙන් අවම ලෙස සියයට 30 ක් ලාභාංශ ලෙස භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. තවද සමාගමේ මුළු ප්‍රාග්ධනයම භාණ්ඩාගාරය සතු වන බැවින් උක්ත සියයට 30 ක ලාභාංශයට අතිරේකව ඉතිරි ලාභාංශයද භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එකඟ නොවේ. එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි තීරණය වේ. | 2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා මෙහෙයුම් අත්පොතේ අංක 5.3 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේ--ශ සංග්‍රහයේ 5.4.4(1) වගන්තිය | පිළිගත හැකි අත්තිකාරම් ගෙවීම් සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයක් අත්තිකාරම් ලෙස ගෙවිය හැකි වුවද සමාගම විසින් විවිධ ප්‍රතිශතවලින් රු. 65,088,221 ක අත්තිකාරම් ගෙවා තිබුණි. | රු. 65,088,221 සඳහා එකඟ වේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.1(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 229,953,287 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 142,062,840 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු. 87,890,447 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මෙම වැඩිවීමට පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මුළු ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් පවත්වාගෙන යනු ලබන සිහිවටන අලෙවිසැල සඳහා 2023 ජනවාරි 01 සිට ජුනි 30 දින දක්වා වන මාස 06 ක කාලය සඳහා උපදේශකවරයෙකු බඳවාගෙන තිබුණු අතර උපදේශකවරයා සමඟ එළඹි ගිවිසුමේ 04 සහ 06 වගන්ති ප්‍රකාරව ඔහුට සියලු දීමනා ඇතුළත්ව රු. 200,000 ක මාසික දීමනාවක් පමණක් ගෙවීමට ගිවිසුම්ගත වී තිබුණි. එහෙත් ගිවිසුමේ වගන්තිවලට පටහැනිව සමාගම විසින් උපදේශකවරයාට 2023 පෙබරවාරි සහ මාර්තු යන මාස දෙක සඳහා ප්‍රවාහන දීමනා ලෙස රු. 142,800 ක මුදලක් ගෙවා තිබුණි.<br><br>තවද උපදේශකවරයා සමඟ එළඹ තිබුණු ගිවිසුමට අනුව ඔහුගේ රැකියා විස්තරය (Job Description) ඇමුණුම A මගින් අමුණා ඇති බව සඳහන් කර තිබුණද, එම ඇමුණුම විගණනයට ඉදිරිපත් නොවුණි. තවද 2023 ජූලි සිට දෙසැම්බර් 31 දින දක්වා මාසික වැටුප රු. | ගෙවීම් සමඟ අමුණා ඇති වාර්තාවලට අනුව උපදේශකයා ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතිය ඇතිව ධාවන ප්‍රස්ථාර හරහා ඔහුගේ ගෙවීම් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. ආරම්භක අවස්ථාවේදී සමාගම වෙනුවෙන් නව සැපයුම්කරුවන් හමුවීම සඳහා උපදේශකයාට මෙම ප්‍රවාහන වියදම් දරා ඇත.<br>එබැවින් මෙය මාසික දීමනාවක් නොවන අතර මෙම අනුමැති ලේඛනය මත පදනම්ව මූල්‍ය අංශය මගින් ප්‍රතිපූර්ණයක් ලෙස ගෙවා ඇත. | සමාගම උපදේශකවරයා සමඟ එළඹුණු ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 275,000 දක්වාද, 2024 ජනවාරි සිට ජුනි 30 දක්වා මාසික වැටුප රු. 300,000 ක්ද වශයෙන් අවස්ථා 02 කදී සේවා කාලය දීර්ඝ කර ඔහුගේ වැටුප ඉහළ නංවා තිබුණු අතර උපදේශකවරයාගේ උපදේශන සේවා කාලය දීර්ඝ කිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. | | |
| (ආ) | 2023 වර්ෂයේ පැවැත්වූ ආසියානු කුසලාන ක්‍රිකට් තරඟාවලිය ප්‍රදර්ශනය කිරීම සඳහා නිරීක්ෂණ තට්ටුව භාවිතා කර තිබුණු අතර ඒ සඳහා සමාගම විසින් රු. 1,685,469 ක වියදමක් දරා තිබුණද ක්‍රිකට් තරඟාවලිය නැරඹීම සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් නොකිරීම හේතුවෙන් කිසිදු ආදායමක් උපයාගෙන නොතිබුණි. | මේ සඳහා විශේෂ ප්‍රවේශපත්‍රයක් නිකුත් නොකළ අතර නැරඹුම් මැදිරිය සඳහා වූ ඇතුල් වීමේ ප්‍රවේශපත්‍රයෙන්ම තරඟය නැරඹීමට අවසර දෙන ලදි. | එක් එක් කාර්යයක් සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කළ යුතුය. |
| (ඇ) | කොළඹ නෙලුම් කුළුණ සමාගමේ 2023 වර්ෂයේ අයවැය මගින් හඳුනාගෙන නොතිබුණු ආදායම් වර්ග 08 ක් සඳහා, කැරකෙන අවන්හලෙන්, ඡායාරූප ගැනීමෙන්, ළමා දුම්රියෙන් සහ සිහිවටන අලෙවිසැලෙන් රු. 81,521,995 ක් ලැබී තිබුණු අතර, 2023 වර්ෂයේ කොළඹ නෙලුම් කුළුණ සමාගමේ අයවැය මගින් මුදල් වෙන්කර නොතිබියදී, Citrus PLC සමාගමේ සහ සිහිවටන අලෙවිසැලේ ඍජු ක්‍රියාකාරී වියදම් සඳහා රු. 90,416,715 ක් සහ නිවාඩු දින වැටුප්, ගිණුම්කරණ සේවා ගාස්තු, අධ්‍යක්ෂ මණ්ඩල දීමනා, සංග්‍රහ වියදම්, ගමන් වියදම්, විගණන ගාස්තු, දුරකථන වියදම්, සනීපාරක්ෂක ගාස්තු යනාදී ආයතනික හා පරිපාලන වියදම් සඳහා රු. 168,783,217 ක් වැයකර තිබුණි. | 2023 වර්ෂය සඳහා අයවැය ලේඛනය සංශෝධනය කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැත. මන්ද, මෙම ව්‍යාපෘතිවල ශක්‍යතාව තනි තනිව ඇගයීමට ලක් කර ඇති අතර එවැනි ව්‍යාපෘති ප්‍රමාද වුවහොත් ආවස්ථික පිරිවැය / අලාභයක් ඇති බැවිනි. | අයවැය ලේඛනය සංශෝධනය කළ යුතුය. |
| (ඈ) | 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ ණයගැති ශේෂයෙන් රු. 3,495,912 ක වටිනාකමැති ණය ශේෂ 09 ක් 2024 මාර්තු 28 දින වන විටත් අය නොවී පැවතුණි. එම දින වන විට මෙම ණය ශේෂ වර්ෂයකට වඩා වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතුණු අතර මෙම ණය ශේෂ අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එකඟ වේ. | හිඟ හිටි ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට ඉහත ණයගැති ශේෂය තුළ වූ බාහිර පුද්ගලික සමාගමක් වෙතින් අයකර ගැනීමට නියමිතව තිබුණු රු. 1,060,875 ක ණය ශේෂය සඳහා සියයට සියයක අඩමාණ ණය වෙන් කිරීමක් සිදුකර තිබුණි. මෙසේ අඩමාණ ණය වෙන් කිරීමට හේතුව, මෙම ආයතනය විසින් සමාගම් භූමියේ කඩයක් | එකඟ වේ.<br>අදාළ මුදල පියවන ලෙස අවස්ථා කිහිපයකදී ඔවුන් වෙත ලිඛිතව දැනුවත් කරන ලද අතර ඔවුන් ලිපියක් මගින් දන්වා ඇත්තේ අදාල වෙළෙඳ කුටිය ආශ්‍රිතව කරන ලද අගය එකතු කිරීම් යටිතල පහසුකම් සංවර්ධනය සහ | හිඟ හිටි ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පවත්වාගෙන යාමට කුලියට ගත් බිම් කොටසේ ඉදි කළ කඩ ගොඩනැගිල්ල වෙනුවෙන් රු. 2,533,870 ක් වැය කිරීම බව සමාගම වෙත දක්වා තිබුණි. | ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. 2,533,870 ක මුදලක් වැය වී ඇති බව දන්වා ඇත. සමාගම විසින් අදාල මුදල් හිලව් කිරීමක් සිදුකළ නොහැකි බව දන්වා ඇති අතර අදාළ මුදල පියවන ලෙස ලිඛිතව දන්වා ඇත .එසේම ඉදිරියේදී සඳහන් කර ඇති ආකාරයට අදාළ මුදල අයකර ගැනීමට කටයුතු සිදු කරමු. | |
| (ඊ) | 2023 මාර්තු 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව අවම වැටුප් පදනම, කාර්යසාධන සමාලෝචන ඇගයීම් වාර්තා, රැකියා විස්තරය අනුව සැකසූ සුදුසුකම් හා නිපුණතා යන තොරතුරු ඇතුළත් කර, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොගෙන, වැටුප් පරිවර්තන සකස් කර, වැටුප් ගෙවා තිබුණි. තවද එක් එක් නිලධාරීන්ට ගෙවූ වැඩිපුර වැටුප හඳුනාගැනීමට අදාළ විස්තර විගණනය වෙත ඉදිරිපත් කරද නොතිබුණි. | 2023 මාර්තු මාසයේදී නව වැටුප් ස්තර (Operational Salary Ladder) හි ස්ථාපිත කිරීමට ප්‍රථම සිදු කිරීමට කටයුතු කර ඇත.<br>ප්‍රධාන විධායක අධ්‍යක්ෂ හා ඉහළ කළමනාකාරීත්වයේ කාර්යසාධක ඇගයීම් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදුකර 2023 මාර්තු මස වැටුප් ස්ථරයේ පිහිටුවා ඇත. | වැටුප් පරිවර්තනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම හා Citrus Leisure පී.එල්.සී සමාගම කොළඹ නෙලුම් කුලුන ගොඩනැගිල්ලේ 25, 26, 27, 28 සහ මුළුතැන්ගෙය Hospitality Industry ක්‍රමයට ව්‍යාපාරයක් සිදු කිරීම සඳහා ගිවිසුම්ගත වී තිබුණි. එම ගිවිසුමේ 8.1 වගන්තිය ප්‍රකාරව දළ ආදායමින් සියයට 3.5 ක කළමනාකරණ ගාස්තුවක්ද, 8.2 වගන්තිය ප්‍රකාරව සෑම මසකම මුළු සේවක පිරිවැයට අමතරව එම පිරිවැයෙන් තවත් සියයට 10 ක ප්‍රමාණයක්ද ගෙවිය යුතුව තිබුණු අතර ඊට අතිරේකව දළ මෙහෙයුම් ලාභයෙන් සියයට 20 ක් ගෙවිය යුතුව තිබුණි. Citrus Leisure පී.එල්.සී සමාගමේ මෙහෙයුම් කටයුතු හේතුවෙන් 2023 ඔක්තෝබර් සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා රු. 20,345,977 ක ශුද්ධ අලාභයක් ලබා තිබියදී එම කාලය සඳහා රු. 1,450,700 ක කළමනාකරණ ගාස්තුවද රු. 1,067,245 ක සේවක වැටුප් පිරිවැයක්ද කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගම | එකඟ නොවේ.<br>නියමිත ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් සහ දිගුකාලීන ව්‍යාපාරික ඉදිරි දර්ශනය සලකා බැලීමෙන් පසු ගිවිසුම් වගන්ති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත.<br><br>කෙසේ වුවත් සමාගමේ මෙම නව ව්‍යාපාරයේ ප්‍රගතිය මත පදනම්ව ගිවිසුමේ ක්‍රියාකරු ලෙස Citrus සමඟ සංශෝධිත නියමයන් සහ කොන්දේසි සාකච්ඡා කෙරෙමින් පවතී. | කොළඹ නෙලුම් කුලුන කළමනාකරණ පුද්ගලික සමාගමට වාසිදායක වන පරිදි ගිවිසුම්වලට එළඹිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විසින් ගෙවා තිබුණි. කෙසේ වුවත් ඉහත පරිදි දළ මෙහෙයුම් අලාභයක් ලැබූ අවස්ථාවකදී ක්‍රියා කරන ආකාරය පිළිබඳව ගිවිසුමේ කොන්දේසි ඇතුළත් කර නොතිබුණි.<br>තවද සමාගම විසින් Citrus Leisure පී.එල්.සී සමාගමට මාසික ඉලක්ක ලබාදී නොතිබුණු අතර එහි කටයුතු අධීක්ෂණය සඳහා වගකිව යුතු නිලධාරියෙකු පත්කර නොතිබුණි. තවද ඉහත ගිවිසුමේ 3.1(a) වගන්තිය ප්‍රකාරව සේවකයින් තෝරාගැනීම, පත්කිරීම, සේවය අවසන් කිරීම හා වැටුප් තීරණය කිරීම සමාගම සමඟ සාකච්ඡා කර තීරණය කළ යුතු වුවත් Citrus Leisure පී.එල්.සී සමාගමේ සේවකයින් තෝරාගැනීම, පත්කිරීම, සේවය අවසන් කිරීම හා වැටුප් තීරණය කිරීමේ කිසිදු කාර්යයකට සමාගම සම්බන්ධ වී නොතිබුණි. එම තත්ත්වය හේතුවෙන් Citrus Leisure පී.එල්.සී සමාගමට අවශ්‍ය වන පරිදි සේවකයින් බඳවාගැනීම, වැටුප තීරණය කිරීම සිදුකළ හැකිව තිබුණු අතර එම සමාගම ඉදිරිපත් කරනු ලබන ඕනෑම වැටුප් හා දීමනාවක් සමාගම විසින් ගෙවීමට බැඳී තිබුණි. එසේම ජංගම දුරකථන ලබාදීම සඳහා රු. 1,013,910 ක් ගෙවා තිබුණද ඒ සඳහා ගිවිසුමෙන් අනුමැතියක් ලැබී නොතිබුණි. | | |
| (ආ) | සමාගමේ පවත්වාගෙන යනු ලබන කැරකෙන අවන්හල සේවකයින් සඳහා නිල ඇඳුම් ඇතුලු අයිතම මිලදී ගැනීම සඳහා සැපයුම්කරු වෙත ගැනුම් ඇනවුම් යවා තිබුණු අතර ඔහු විසින් එවන ලද නාමමාත්‍ර ඉන්වොයිසි 03 ක් පදනම් කරගෙන පිළිවෙළින් රු. 495,600 ක්, රු. 3,240,000 ක් සහ රු. 4,013,800 ක් ලෙස එකතු වටිනාකම රු. 7,750,190 ක් එනම් ඉන්වොයිස් වටිනාකම්වලින් සියයට 70 ක ප්‍රමාණයක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. මෙම සැපයුමෙන් රු. 84,700 ක් වටිනා ලිනන් රෙදි 2024 මැයි 27 දින වන විටත් සපයා නොතිබුණි. | අවන්හල සහ භෝජන සංග්‍රහ ශාලා 2023 දෙසැම්බර් මස විවෘත කිරීමට කටයුතු යොදා පැවති අතර එහි සේවකයන්ගේ නිම් ඇඳුම් සහ ඒ ආශ්‍රිත රෙදිපිළි කඩිනමින් ප්‍රසම්පාදනය කර ගැනීමේ ඉක්මන් අවශ්‍යතාවය පැවති අතර ඒ සඳහා අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා සැපයුම්කරු අත්තිකාරම් අයදුම් කර තිබිණි. මෙම හදිසි අවශ්‍යතාවය සලකා බලා ආයතනය විසින් මෙම අමුද්‍රව්‍ය මිලදී ගැනීමට මෙම අත්තිකාරම් මුදල නිදහස් කොට ඇත. මෙම අවන්හල සහ භෝජන සංග්‍රහ ශාලා සඳහා ව්‍යාපාරයේ වර්ධනය සඳහා සේවක ඉල්ලුම මත වරින් වර සේවකයන් බඳවා ගන්නා අතර ඔවුන් සඳහා අවශ්‍ය නිම් ඇඳුම් අවශ්‍යතාවය මත සැපයුම් කරු විසින් නිමකර සපයන ලදී. දැනට මෙම අයිතමයන් බහුතරයක් සපයා ඇති අතර ඉදිරි සේවක බඳවා ගැනීම මත ඉතිරි සැපයුම් සිදු කරනු ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.1 (1) වගන්තිය ප්‍රකාරව අත්තිකාරම් ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.7 ප්‍රකාරව, සමාගමේ රු. 393,621,112 ක් වූ ස්ථාවර වත්කම් හා ගබඩා ද්‍රව්‍ය වාර්ෂික සමීක්ෂණයක් සිදුකර වාර්තා ඉදිරිපත් කළ යුතු වුවද 2024 මැයි 27 දින දක්වා වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වේ. සමීක්ෂණ මණ්ඩලය 2024 ජුනි 30 වැනි දිනට සිදු කිරීමට සැලසුම් කර ඇත | රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතේ 6.7 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | කොළඹ නෙලුම් කුලුන පිළිබඳ භෞතික පරීක්ෂාවේදී කුලුනේ නැරඹුම් මහලේ බිත්ති ආලේපවලට හානිවන ලෙස නම් හා විවිධ රූප ඇඳ තිබුණි. එම හානි අවම කිරීම සඳහා රු. 1,084,050 ක් වැය කර නැරඹුම් පීටිකාවේ විදුලි ආලෝකයෙන් දැල්වෙන ප්ලාස්ටික් පුවරු සවි කළද ඒවාද නරඹන්නන් විසින් හානිකර තිබුණි. කුලුන තුළ ආරක්ෂක කැමරා පද්ධති සවිකර එහි ක්‍රියාකාරීත්වය සඳහා සේවකයින් යොදවා තිබුණද එම හානිය ගණනය කිරීමට හා හානි කළ පුද්ගලයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය අවම ආරක්ෂක නිලධාරීන් යෙදවීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි. | එකඟ නොවේ.<br>නෙලුම් කුලුනේ නැරඹුම් මහලේ බිත්ති ආලේපවලට හානි කරන පාසල් සිසුන් නොවන අයවලුන් පොලීසිය වෙත භාරදෙනු ලබන අතර එම දර්ශන සහිත අදාළ සිදුවීම් රූපවාහිනී ප්‍රවෘත්ති විකාශයන් හරහාද විකාශනය කරවන ලදි. තවද, එසේ හානි සිදු නොකරන ලෙස දැනුවත් කිරීම් වැඩසටහනක්ද ප්‍රවෘත්ති සහ සමාජ මාධ්‍ය ඔස්සේ සිදුකරන ලදි. මෙකී වැඩපිළිවෙලවල් හේතුවෙන් මෙම තත්ත්වය සතුටුදායක ලෙස පාලනය කරගත හැකිවිය. අදාළ තත්ත්වය පාලනය කිරීම සඳහා පිළියමක් වශයෙන් විදුලි ආලෝකයක් දැල්වෙන ප්ලාස්ටික් නාම පුවරු සවිකරන ලද අතර නරඹන්නන් විසින් එය මත දෑත් තැබීමේදී එම ප්ලාස්ටික් පුවරු සඳහා හානි සිදුවූයේ ඒ සඳහා යොදා ඇති ප්ලාස්ටික් බෝඩ් නියමිත ප්‍රමිතියෙන් (යොදා තිබුණු ප්ලාස්ටික් බෝඩ් ඝණකම මිමී 02) යුක්ත නොවූ බැවිනි. තවද නරඹන්නන් විසින් එම ප්ලාස්ටික් පුවරු වෙතට සමීපව සිටීමේදී එම ප්ලාස්ටික් පුවරුවලට හානිවන අයුරු නිරීක්ෂණය කිරීම වැනි සියුම් දසුන් නිරීක්ෂණ සඳහා දැනට සවිකර ඇති කැමරා පද්ධතිය මගින් ග්‍රහණය කිරීමට හැකියාවක් නොමැත. එමෙන්ම විශාල නරඹන්නන් පිරිසක් පැමිණෙන අවස්ථාවන්හිදී නැරඹුම් මැදිරියේ පවතින අධික තදබදය හේතුවෙන් එහි ආරක්ෂාව සඳහා යොදවා සිටින ආරක්ෂක නියාමකයින් හට ක්ෂණිකව අදාළ ස්ථානයන්හි ස්ථානගත වීම ප්‍රායෝගික නොවන්නකි.<br><br>මෙම කරුණු සලකා බැලීමෙන් පසු නැරඹුම් මහලේ නිරීක්ෂණ කටයුතු සඳහා දැනට පවතින ආරක්ෂක කැමරා පද්ධතිය ප්‍රමාණවත් නොවන බැවින් එහි කැමරා ප්‍රමාණය වැඩි කිරීමටත් ඉතා හොඳ ප්‍රමිතියකින් යුතු (මිමී 08 ඝණකමින් යුතු) ප්ලාස්ටික් පුවරු සවි කිරීමට කටයුතු කරමින් පවතී. | අවශ්‍ය අවම ආරක්ෂක නිලධාරීන් යෙදවීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2022 අගෝස්තු 02 දින අත්සන් කළ කළමනාකරණ ගිවිසුමේ වගන්ති අංක 7(b) හා 2023 අප්‍රේල් 10 දින අත්සන් කළ කල් බදු ගිවිසුමේ 2.2(u) ප්‍රකාරව සමාගම විසින් ලබාගත යුතු යන්ත්‍රෝපකරණ බිඳ වැටීමේ රක්ෂණය හා ඉලෙක්ට්‍රොනික රක්ෂණය 2023 දෙසැම්බර් 31 දින වන විටත් ලබාගෙන නොතිබුණි. | එකඟ වේ. | සමාගම විසින් යන්ත්‍රෝපකරණ බිඳ වැටීමේ රක්ෂණය හා ඉලෙක්ට්‍රොනික රක්ෂණය ලබාගත යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණු බැවින් සාධාරණ ප්‍රසම්පාදනයන් කළ බවට හා 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය. | එකඟ වේ. 2024 සිට ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරනු ලබයි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |
| (ආ) | ප්‍රවේශපත්‍ර මුද්‍රණය කර සපයා ගැනීමේ රු. 3,055,875 ක ප්‍රසම්පාදනය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1(ඇ), 5.3.11 සහ 5.4.10(ආ) අනුව කටයුතු කර නොතිබුණි. තවද ලංසු ලේඛනවල Section ITV 05 වන වගන්තිය ප්‍රකාරව ලංසුකරු වට්ටම් ලබා දෙන්නේ නම් එම වට්ටම ඇතුළත්ව මිල කැඳවීම් ඉදිරිපත් කරන ලෙස දක්වා තිබුණද දෙවන අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු එසේ කර නොතිබියදී 2023 පෙබරවාරි 16 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයෙන් පසුව එනම් 2023 පෙබරවාරි 17 දින සංශෝධිත ලංසුවක් එවා තිබුණි. එම සංශෝධිත ලංසුව සමාගමට ලැබුණු ආකාරය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දැනට සිදුකරන ප්‍රසම්පාදන සඳහා මෙම ක්‍රමයන් නිවැරදි කර ලංසු ලේඛන සහ පුවත්පත් දැන්වීම් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටුවේ පරීක්ෂාවට සහ අනුමැතියට යටත්ව ප්‍රසම්පාදන කටයුතු සිදුකරනු ලැබේ.<br>ලංසුකරුවන් ලංසු ඉදිරිපත් කිරීම දිරිගැන්වීමේ අරමුණින් ලංසු ආරක්ෂණයක් සහ කාර්යසාධන සුරක්ෂණයක් ලබා නොගැනීමට තීරණය විය.<br>මෙම ප්‍රසම්පාදනයේ වැඩිම ටිකට්පත් ප්‍රමාණයක අවශ්‍යතාවය පැවතියේ රු. 500 සහ රු. 200 ටිකට්පත් වන අතර එහි ප්‍රමාණය පිළිවෙලින් 10,000 සහ 9,000 වේ. නමුත් එවකට පැවති ආනයන සීමා හේතුකොට ගෙන එකම සැපයුම්කරුවෙකුට වැඩිම ප්‍රමාණයක අවශ්‍යතාවය සහිත ටිකට්පත් මුද්‍රණය ලබාදීම අප ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගය වන නැරඹුම් පර්යන්තයට එන අමුත්තන් හට ටිකට්පත් නිකුත් කිරීමට නොහැකි වීමේ අවදානම සලකා බලා ප්‍රසම්පාදන කමිටුව විසින් රාජ්‍ය ආයතනයක් වන ලේක් හවුස් ආයතනය වෙතින් ලබාගත් වට්ටමකට අනුව එම ආයතන 02 වෙත (ලේක් හවුස් ආයතනය සහ නැප්කෝ ආයතනය) ටිකට්පත් සැපයුම ප්‍රදානය කරන ලදි. මෙහිදී අප | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1(ඇ), 5.3.11, 5.4.10(ආ) ලංසු ලේඛනවල Section ITV 05 වන වගන්තිය අනුව කටයුතු කළ යුතුය සහ සංශෝධිත ලංසුව සමාගමට ලැබුණු ආකාරය හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ආයතනය වෙත මූල්‍යමය පාඩුවක් සිදු නොවන ලෙස රටේ තත්ත්වය අනුව අවදානම මගහරවා ගැනීමට පමණක් ප්‍රසම්පාදන කමිටුව තීරණය කොට ඇත. | |
| (ඈ) | විනෝද උද්‍යානය සඳහා බදු රහිත රු. 40,302,089 ක Kids Play උපකරණ සැපයීම සහ ස්ථාපනය කිරීමේ ප්‍රසම්පාදනය සඳහා ඇස්තමේන්තුවක් පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(1) වගන්තියට පටහැනිව සියයට 80 ක් එනම් රු. 32,241,671 ක් 2023 ඔක්තෝබර් 20 දින අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. 2024 මැයි 27 දින වන විටත් මෙම කාර්යය අවසන් කර ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත් නොවීම හේතුවෙන් එම මුදල් ආයෝජනය කර ලැබෙන පොලී ආදායම සමාගමට අහිමි වී තිබුණි.<br><br>තවද 2023 සැප්තැම්බර් 01දින එකතු කළ අගය මත බදු රහිත වටිනාකම වූ රු. 40,302,089 කට ලංසුකරුට ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමෙන් පසු 2023 සැප්තැම්බර් 05 දින ලංසුකරු විසින් මුල් ලංසුවේ ඇතුළත් කර නොතිබුණු රු. 5,062,985 ක ආනයන බදු එක් කිරීම හේතුවෙන් නව ලංසු මිල රු. 45,365,074 ක් වී තිබුණි. | එවකට පැවති ආර්ථික තත්ත්වය අනුව අලුතින් ආරම්භ කළ අප ආයතනය පිළිබඳව සැපයුම්කරුවන් අතර තිබුණු මතය හේතුකොට ගෙන සියයට 80 ක අත්තිකාරම් සුරක්ෂණයක් සහිතව මෙම අත්තිකාරම් ලබාදීම සිදුකර ඇත. එම සුරක්ෂණය දීර්ඝ කිරීමට සැපයුම්කරුවන්ගෙන් ඉල්ලීම සිදුකර ඇති අතර සැපයුම්කරු ඒ පිළිබඳව කටයුතු සිදුකරමින් පවතී.<br><br>ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී ලංසුකරු විසින් මෙම ආනයන බදු සහ සමාජ ආරක්ෂක බදුවල දළ සංඛ්‍යාවන් පිළිබඳ ලංසුපතේ දක්වා තිබුණි. අප ආයතනය විසින් බදු සඳහා දැනට ගෙවීමක් සිදුකර නොමැති අතර බදු සත්‍ය වශයෙන් ගණනය කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ගෙවීම සිදුකරනු ලැබේ. | සියලුම මිලදීගැනීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. ලංසු ඉදිරිපත් කිරීමේ කොන්දේසි අනුව ක්‍රියා කළ යුතු අතර ප්‍රසම්පාදන කාර්යයන් නිසි කාල සීමාව තුළම නිම කරගත යුතුය. |
| (ඇ) | සමාගමේ ටිකට්පත් කවුන්ටර් නවීකරණය කිරීම සඳහා සමාගමේ ඉංජිනේරු විසින් ඉංජිනේරු ඇස්තමේන්තුව සහ ප්‍රමාණ පත්‍ර නිසි පරිදි සකස් නොකිරීම හේතුවෙන් යථෝක්ත කාර්යය ඉදිකිරීම් ආයතන 02 ක් මගින් සිදු කිරීම වෙනුවෙන් රු. 1,679,379 ක් ගෙවා තිබුණි. | ප්‍රවේශපත්‍ර කවුන්ටර් 02 වෙනස් කිරීමේ සම්පූර්ණ කාර්යය සඳහා රු. 1,960,800 කට ආයතන 02 ක් ලංසු ප්‍රදානය කර ඇත. | ඉංජිනේරු ඇස්තමේන්තුව සහ ප්‍රමාණ පත් නිසි පරිදි සකස් කළ යුතුය. |
| (ඉ) | වටිනාකම රු. 18,810,000 ක් වූ LED 20x10 තිර සැපයුම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීමේ ප්‍රසම්පාදනය සඳහා භාණ්ඩ 2023 මැයි 17 දින සමාගම වෙත සපයා තිබුණු අතර කොන්ත්‍රාත්තුවෙන් සියයට 80 ක් එනම් රු. 15,048,000 ක් ගෙවා තිබුණි. 2022 දෙසැම්බර් 02 දින කොන්ත්‍රාත්තුව නිම කළ යුතු වුවද 2024 මැයි 27 දින වන විටත් කොන්ත්‍රාත්තුව අවසන් කර නොතිබුණි. | සැපයුම්කරු දැනට ඉහත සඳහන් ප්‍රසම්පාදනයට අදාල සියලුම අයිතම අප ආයතනය වෙත ලබාදී ඇති අතර භෞතික ප්‍රගතිය 90% පමණ වේ .අප ආයතනය විසින් නිමකල යුතු පැනල් බෝඩ්වල කටයුතු නිමකිරීමෙන් පසුව ඉදිරි සති දෙකක් තුල ඉහත කොන්ත්‍රාත්තුව නිම කල හැක. | ප්‍රසම්පාදන කටයුතු නිසි කාලය තුළ අවසන් කර ගැනීමට කටයුතු කළ යුතුය. |